# 35

# වරෙන්තුව කාව්‍ය සංග්‍රහය

*එම්. එස්. නිසංසලා සෝමරත්න*

කැලණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරයා වශයෙන් කටයුතු කරන මහාචාර්ය කුලතිලක කුමාරසිංහ මහතා ශාස්ත්‍රාලීය විද්වතුන් අතර පූරෝගාමී මෙහෙවරක් ඉටු කරන්නෙකි. නූතන සිංහල කෙටිකතාව පිළිබඳ පුළුල් පර්යේෂණයන්හි නිරත වෙමින් කෘති ගණනාවක් රචනා කොට ඇති ඔහු **වරෙන්තුව** නමැති අභිනව කාව්‍ය සංග්‍රහයෙන් සහෘද පාඨක ප්‍රජාව වෙත යළිත් පිවිසෙයි. මීට පෙර කාව්‍ය සංග්‍රහ දෙකක් පළ කළ හෙතෙම මෙවර ස්වකීය අනුභූතීන් නව ඉසව්වක තබන්නට යත්න දරයි. **නැත ලොවේ අන් රසඳුනා හා අසනිපාතය** කුමාරසිංහ කවියාගේ කව් සම්භාරය වන්නේය.

කවි හතළිස් අටක් සංගෘහිත **වරෙන්තුව** කාව්‍ය සංග්‍රහයේ විවිධ අනුභූතීන් රැගත් කාව්‍ය නිමැවුම් බොහොමයක් වේ. නේක අත්දැකීම් අත්විඳින්නෙකු වශයෙන් හඳුන්වා දිය හැකි කුලතිලක කුමාරසිංහ කවියා ඒ ඇසුරෙන් ස්වකීය කවිත්වය ඔප මට්ටම් කර ගැනීමට වෙර දරන අයුරු **වරෙන්තුව** ගම්‍ය කරවයි. වරෙන්තුව කාව්‍ය සංග්‍රහය දුලබ අත්දැකීම් හා පරිපාලකයකු ලෙස ලද අත්දැකීම්, ප්‍රකට පුද්ගල චරිත, ළමා විය, ප්‍රේමය, කාලයෙහි ප්‍රබලත්වය වැනි තේමාවන් ඔස්සේ කවියාගේ අත්දැකීම් විසිර යයි. කුමාරසිංහ කවියාම ප්‍රකාශ කරන ආකාරයට ජීවිතය පුනරාලෝකනය කිරීමේ දී ඇති වූ සංකල්පනා ඔහු අතින් මෙසේ කවි ලෙස එළි දැක ඇත. එහිදී කවියාගේ ප්‍රබලතා මෙන් ම දුබලතා ද ඉස්මතුවන අවස්ථා හඳුනා ගත හැකිය.

සියලුම කලාවන් අතරින් අතිශය සියුම් කලා මාධ්‍යයක් වන කවියෙන් සහෘදයාගේ බුද්ධියටත් හදවතටත් එකවර ආමන්ත්‍රණය කිරීමේ හැකියාව ඇත. කවියකින් කවියා කරන්නට උත්සාහ ගන්නේ කියන දේ නොව නොකියන දේ කියන්නට මඟක් සලසා ගැනීම ය. එහිදී හුදෙක් වචනයෙන් ප්‍රකාශ කරන දෙයට වඩා අඟවන දේ ඉතා වැදගත් ය. විශේෂයෙන් කවි පාදක කරගන්නා කවර අනුභූතියක් වුව ද විස්තර කථනය නොකොට වේදයිතය සියුම් ලෙස ප්‍රකාශ කිරීම කවියෙකුට ඇති අභියෝගයකි. කුමාරසිංහ කවියාගේ වරෙන්තුව නමැති පද්‍යයෙන් එවැනි උත්සාහයක් විද්‍යමානය.

"මට අවුරුදු පනස් අටයි
මරණයෙ දොරටුව අසලට



කෙමෙන් කෙමෙන්
බඩගාගෙන ළඟාවෙමින් සිටින්නෙමි මම
උපන් දිනය හඬගා මට
මරණ වරෙන්තුවක් ලෙසින්
උදෑසනම කන් බෙරයට
හඬගා බෙරිහන් දුන්නේ......"

"......උපද්දවා හැම වසරෙම
වසර අගදී මගෙ මිනියට
මා ලවාම අත්පැන් ඉස
මිනී පෙට්ටියේ බහවා
පියන වසා ඇණ ගසලා
මා ලවාම කර තියාන......."

කවියා උපන්දිනය දැක ඇත්තේ මරණයට සමීපවීමක් ලෙසය. බැලූ බැල්මට භාෂාව, ආකෘතිය, වස්තු විෂය ආදියේ ස්වාධීනත්වයක් නොපෙනුණද කවියාගේ හදවත පෙළන යම් දැක්මක් මෙහි හඬ බවට පත්ව ඇති බව පෙන්වා දිය හැකිය. මීට අමතරව **ජීවිතය, ගමට ගිය දා** වැනි පද්‍ය රචනා පිළිබඳ අවධානය යොමු කිරීමේ දී කවියා විඳි සෞන්දර්ය ඔස්සේ කිසියම් අරමුණක් ස්පර්ශ කිරීමෙන් එළැඹෙන නැඹුරුව යම්තාක් දුරට තීව්‍රව නිරූපණය කිරීමට කුමාරසිංහ කවියා වෙහෙසී ඇති බව පැහැදිලි ය.

කුමාරසිංහ කවියාගේ ඇතැම් පද්‍ය රචනාවන්ට විෂය වී ඇත්තේ දුලබ වූ ඇත්දැකීම්ය. ගුවන් ගමන, ත්සුනමි, සෝම හිමි වැනි පද්‍ය නිදසුන් ලෙස දැක්විය හැකිය. වරෙන්තුව කාව්‍ය සංග්‍රහයේ ඇතුළත් "නංගී" පද්‍ය රචනය මිනිස්කම ගැඹුරින් හඳුනාගත් ප්‍රඥාංකුරයකුගේ හඬක් දැවටී ඇති කවි පෙළකි.

"ගෙදර අපෙ සුරතලී
අප සමඟ කෙළි දෙළෙන්
උස් මහත් වූ එදා
එකල පාසැල් ගොසින්
යෙහෙළියන් සමඟ නිති
සිනා සයුරේ ගිලුණු
සුදු නංගි"

"......අයියගේ නිවෙස රැඳී
ඉවිලි පිවිලි කරට ගෙන
හිමිදිරියෙ නැගිට පෙර
ඉටු කරයි සියලු මෙහෙ
පවුලෙ අය බැහැර ගිය මොහොතෙ සිට
කම්කටොළු පරිතාප ගැන හිතනවද නංගි......."

ප්‍රේමය නිසා දුකට පත්ව සිටි කාන්තාවක් සිය සොහොයුරාගේ නිවසෙහි රැඳී සිටිමින් එහි සියලු කටයුතු ඉටු කර දෙමින් සොහොයුරාගේ අභිවෘද්ධිය ප්‍රාර්ථනා කරමින් ම ජීවිතයේ සැඳෑ සමයට එළඹ සිටියි. ඇය සොහොයුරාගේ රැකවරණය ද ලබන්නීය. එසේ වුව ද සොහොයුරාගේ මරණයෙන් පසු ඇයට කිනම් ඉරණමක් අත්වේද යන්න අවිනිශ්චිත ය. මෙසේ අසරණ කාන්තාවගේ ජීවිතයේ එක් පැතිකඩක් සියුම්ව ස්පර්ශ කරන්නට කවියා උත්සාහ ගෙන ඇත.

වරෙන්තුව කාව්‍ය සංග්‍රහයේ "එදා අද" නමැති පද්‍ය රචනය කවියා නව්‍ය සංකල්ප රූප උපයෝගී කොට ගත් අපූරුව හෙළි කරයි.

"එදා තුනුවිල
මෙදා පල්වල
එදා සුරපුර සිරි පෑ
මෙදා පෙන්වයි අපා- ලොව පපා අසිරිය"

අනුප්‍රාසාත්මක බස් වහරක් ඇසුරින් ස්වකීය සිතැ´ගි පෙළ ගස්වන්නට කවියා මෙහි දී සමත් වේ.

කුමාරසිංහ කවියාගේ වරෙන්තුව කාව්‍ය සංග්‍රහයෙහි ප්‍රේමයෙහි විචිත්‍රත්වය හා සංකීර්ණත්වය ඉස්මතු කරවන පද්‍ය ගණනාවක් අන්තර්ගතය.

"ඔබ රසඳුනකි මා නෙතට
සුගඳ පුන් මානෙල් මලක් සේ හැඟේ මා හදට
මා සිත නිවී යයි
මා ගත අවදිවෙයි
මා සිහින දෙවඟන
සදා කල්හි ඔබමය මා සොඳුර"
(සොඳුර)

"පතුලෙ හද රැඳුණු ඒ
නොවක් පැතුමෙන් පිරුණු
අමිල ගුණ සුවඳ ඇති
රජස් මළ දුරැරලූ
සුවඳ දෙන පුබුදු කර"
(ආදරය)

"මැදියම් රැයෙ නැගිට
ඔබේ සුදු මුහුණ දෙස
මා බලා සිටින සඳ
පොහොය පසළොස් රැයේ
තුරු අතර සැඟවී සිටි
මඬල පුර සඳ හොරෙන්
මගේ සිත හඳුනගෙන
සිත් ඇසින් මා ඔබගෙ
සුපුන් සඳ හාදුවෙන්
සිප වැළඳ ගත්තෙ යැයි........"
(සඳමඩල)



උක්ත පද්‍ය රචනා ප්‍රේමයේ ආකර්ෂණීය ස්වභාවය ප්‍රකට කරවන්නට කවියා ගත් උත්සාහය ගම්‍ය කරවයි.

කුමාරසිංහ කවියා මෙම කාව්‍ය සංග්‍රහයේ දී විවිධ ආකෘති නිර්මාණය කර ඇති බව ද පැහැදිලිය. ආකෘතිය කවරක් වුව ද අන්තර්ගත සන්දර්භයේ ඇති ප්‍රබලත්වය, වාච්‍යාර්ථය ඉක්මවා යන ඉසියුම්, ඉඟුරු ස්වභාවය සේම වාග් බාහුල්‍යයෙන් මිදීම කවියක සාර්ථකත්වයට විශේෂයෙන් වැදගත් වන්නේය. කුමාරසිංහ කවියා ස්වකීය අත්දැකීම් අව්‍යාජව ප්‍රකාශ කිරීමට උත්සාහ කළ ද එහිදී කවියක තිබිය යුතු සියුම් ලක්ෂණ ගිලිහී ගිය අවස්ථා බොහොමයක් ද **වරෙන්තුව** කාව්‍ය සංග්‍රහයෙන් හමුවේ.

"කවිය, කෙටිකතා, නවකතා
සාහිත්‍ය විචාරය - රඟ කලා
අප දෙ ඇස් පුබුදුවා
ඔබ මිසක් අන් කවුරු
විදුලකර සරසවිය - ලෝකයට රැගෙන ගිය
ප්‍රඥා ප්‍රදීපය - මගෙ සොඳුරු මහැදුරු ය
මා ඔබගෙ සෙවණ ලද
කදෝ පැණියෙකි,
ආධුනික ලේඛක සංගමය
විචාර සභාවද, නිර්මාණ සභාවද
සිංහල සංගමය - මෙමුළු පණ ගන්වමින්
අපට මග පෙන්වමින්"

"විමල් දිසානායකට" නමැති පද්‍ය රචනය කුමාරසිංහ කවියා වාග් බාහුල්‍යයෙන් පුරවා ඇති ආකාරය මෙයින් ගම්‍ය වේ. කවියේ ඉඟුරු ආස්ථානයන් ස්පර්ශ නොකළ මෙවැනි රචනා කිහිපයක් ම මෙහි ඇතුළත් ය. මුහුණ, පරාක්‍රම කොඩිතුවක්කුට වැනි කාව්‍ය රචනයන් ද තවත් එවැනිම රචනා දෙකකි. වචන සමූහයක් පෙළ ගැස්වීමට පමණක් ගත් උත්සාහයක් මෙයින් ප්‍රකාශිතය. එහෙත් සාර්ථක කාව්‍ය නිර්මාණයක් බිහි කිරීමට නම් ව්‍යංජනා ශක්තියකින් පරිමිත ප්‍රකාශන මාර්ගයක ගමන් කිරීම අවශ්‍ය ය. වඩා දීර්ඝ වූ පද යෝජනය ගැන ඇතැම් පද්‍ය ඉසියුම් අරුත් ජනනයට මහත් සේ බාධා පමුණුවනු පෙනේ.

කවියක් සේ ම කවියේ නම් කිරීම ද අපූර්ව විය යුතුය. එය සුලබ කිරීම කවියෙකුට තරම් නොවන්නේ ය. වරෙන්තුව කාව්‍ය සංග්‍රහයේ ද ඒ දුබලතාව වරින්වර ඉස්මතු වනු පෙනේ. උදාහරණයක් ලෙස ළඳ, ආදරය, සොඳුරිය, නික්මයාම ආදිය පෙන්වා දිය හැකිය. එමෙන්ම අපූර්ව කවි නම් කිරීම් ලෙස ද මාතෘකා කිහිපයක් හමුවේ. ඒවා අතර වරෙන්තුව, සඳ මඬල, ගුවන් ගමන, කුරුම්බැට්ටි උඩ යනවා - පැති බෝම්බ බිම එනවා විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

සමස්තයක් ලෙස ගෙන විමසීමේ දී වරෙන්තුව කාව්‍ය සංග්‍රහයෙන් ප්‍රඥාව දල්වන කිසියම් දැක්මක් විශද වන බව පිළිගත හැකිය. කාව්‍ය සංකල්පනා තව දුරටත් ඔප මට්ටම් කොට ගත්තේ නම් මෙය මීට වඩා සාර්ථක කෘතියක් බවට පත් කිරීමට හැකියාව පැවතිණි.

කුමාරසිංහ කවියා මෙහි දී සරල භාෂා භාවිතයට පෙලඹී ඇති බව ද පැහැදිලිය. කාව්‍යකරණයේ දී භාෂා පරිචය අතිශය වැදගත් සාධකයක් වන්නේය. ගැඹුරු කෝෂාර්ථ ඇති වචන කවියට යොදා ගැනීම හෝ මතුපිට සුන්දර කාව්‍යෝක්ති සොයා යෑම භාෂා පරිචය ලෙස තේරුම් නොගත යුත්තකි. ඉතාම සරල වචනයකට පවා විවිධ සන්දර්භයන්හි දී විවිධ අරුත් උත්පාදනය කළ හැකිය. **වරෙන්තුව** කාව්‍ය සංග්‍රහයේ දී නිර්මාණය සඳහා නිමිත්ත වී ඇති පුළුල් අත්දැකීම් ක්ෂේත්‍රය සරල බසකින් සහෘදයා වෙත ඉදිරිපත් කිරීමට නම් මීට වඩා සාධනීය ලක්ෂණ පිරිවැරූ කාව්‍ය ග්‍රන්ථයක් බවට **වරෙන්තුව** පත් කිරීමට ඉඩ ප්‍රස්ථා පැවති බව හඳුනා ගත හැකිය.

# 36

## *Asanipaathaya* - A Critical Evaluation

Prof: Kulatilaka Kumarasinghe's, latest poem collection "*Asanipaathaya*" is a result of an artistic temperament which inspired him to re-create various experiences derived from his life and milieu. Almost all the poems of this anthology are written in the verse libre or free verse from and apart from Sinhala poems it also consists of translations of Haiku and Thanka poems of Japanese Verse tradition as well as poems written in English.

Through some of these poems, the poet attempts to transmit aesthetically to his connoisseurs a realistic knowledge of incompleteness and disorderliness of stabilized social institutions.

These Poems indicate that our bard is gifted with perception and vision. The poem titled "*Natha loway un Rasanduna*" speaks in a most delightful ironic tone. Here a University Scholor who merely s survives bleak living conditions, tries to reach his personal; salvation through cramming futile and barren notes aspiring for a felicitous tomorrow. The lyrical conclusion becomes more striking because it emerges out of the conversational ironic utterances."Andiri Vatena Mohotaka Pusthakaala yedi" is certainly a striking poem because the poet attempts to capture and recreate the contradiction between the emotional life and the intellectual life of modern man, using symbols such as "rasa polowa" (Carnal delights). Here the natural humane passions rebel against the artificial discipline acquired by the rigid intelligence, and in the word rasapolowa, it self, there is a reference to the vocabulary of the traditional sinhala verses. Such an idiom is embedded firmly in connoisseur's sub-conciousness and he finds it is easy to appreciate the poem since the novel argument is interlaced with the traditional hues with which he is familiar with poems such as "Landay Obatai", "Dream goddess", "Sihina Devangana" have the shadow of glori fying the Anima Concept, exposed by the eminent Psychologist Carl Jung. According to Jung, in every male there is an unconcious female being. He argued that as long as man was unconcious of this presence he tends to project this imaginary female ideal on other females while projecting this Animic Condition on a normal woman he sometimes elevates herself into an ideal goddess. He